කෙටි කතාව

ඇය ද මිය ගියා ය

පද්මසිරි හේරත්

වෙරබි වික්ටෝරියා

සයිමන් සහ ජේන්නෝනා නීතියෙන් විවාහ කරවා ඉඩම් කැබැල්ලක් ද වෙන්කර ගෙයක් හදා ගැනීමට ලී පොල්අතු ආදියද සපයා දී විය පැහැදම් දැරුවේ ද ගුරු යුවළ විසිනි. නිවසට අත්‍යවශ්‍ය මේසයක් පුටු දෙකතුනක් පෙට්ටගමක් යනාදිය ද පරණ බඩු ගබඩාවෙන් තෝරා ගන්නා ලෙස ලොකු ඉස්කෝලෙ මහත්තයා සයිමන්ට උපදෙස් දුන්නේය.

ලොකුහාමිනේගේ දුර නෑයෙකු ද වන කුඩලිගම නෝනා යැයි ගම්මුන් හැඳින්වූ තරුණිය ගුරුගෙදර කලක් නැවතී සිට නගරයේ පාසැලක අධ්‍යාපනය ලබා ගුරුවරියක් ලෙස පත්වීමක් ලැබීය. ඇය ජේන්නෝනාගේ දියණිය යසවතී සාමාන්‍ය පෙළ විභාගයට පෙණීසිටින අවදියේ ලොකු හාමිනේගේ කීම පිට යසවතීට ගණිත පාඩම් කියා දීමට කැමැත්ත පළකලාය. යසවතී ගණිත පාඩම අවසානයේ මුවම්පැලැස්සට හෝ වේදිකාවෙන් ගුවනට වැඩසටහනට සවන් දීමට ගුරුගෙදර රැඳුණි. මෙවන් දිනවල ජේන්නෝනා ද ඇය කැටුව යෑමට ගුරුගෙදර රැඳෙමින් බුදු පුදට කටයුතු සූදානම් කිරීම, චිමිනි ලාම්පුව දල්වා සාලයේ කනප්පුව මත තැබීම වැනි කාර්යයන්හි යෙදේ. ඇය එසේ කලේ කපුවෙකු දේවාලයක කටයුතු සිදු කරනයුරු මහත් භක්ත්‍යාදරයකිණි. තම දෙවන දරුවා, තිලකගේ සියළු වැඩ කටයුතු නැන්දම්මා අතින් කෙරෙන නිසා දිවා කාලයේ ලොකුහාමිනේ අවටම ගැවසීම ජේන්නෝනාගේ දින චරියාව බවට පත්වී තිබුණි. බෙදාගත් බත් පතක් ගෙදරට ගොස් දීමට හෝ තිලකව ආච්චිඅම්මාට ආණ්ඩුමට්ටු කර ගනු නොහැකිව බැනවදින විටෙක "මම සුරුස් ගාල එන්නං හාමිනේ""

දෙකට නවා කිහිල්ලේ ගසාගෙන ආ පන් මල්ල බිමතැබූ ගෑහැණිය මැදින් බිමට පාත්වී ඇති ලී ගේට්ටුව ඇරගෙන ගුරුගෙදරට ඇතුළු වෙද්දී සේපාලිකා පඳුර යට පරමල් ඇහිඳිමින් සිටි ලොකුහාමිනේ ඇය දැක
"ආ........ මේ ජේන්නෝනනෙ, ආඑක කොච්චර එකද්ද?" කියමින් පිළිගත්තාය.
"කොහෙ යන ගමන්ද?""""
"සමුපෙට යනගමන් හාමිනේ"
කෙටි තාප්පයේ වාරුවෙන් නැගිට ගත් ලොකුහාමිනේ ඉනේ ඔතාගෙන සිටි ඔසරිපට මුදා මුහුණ පිසදමා ඉදල ගැණීමට යද්දී ඇය වැලකූ ජේන්නෝනා
"ඉන්න හාමිනේ මං අතුගාල දාන්නං" කියා එය අතට ගත්තාය.

පොල් අතුරටාවට මිදුල අමදින ඇය දෙස ලොකුහාමිනේ දිගටම බලා සිටියාය.
සෙවණැල්ල සේ තමා ළඟ ගැවසුන ගෑහැණිය ගෙට ගොඩ නොවැදී මගහැර යාම තරම් සිත් වේදනාවක් ලොකුහාමිනේ මෑත කාලයක විද නැත.

"ඕකුන්ට හෙන හත වදිනව හාමිනේ ඔය කරපු අපරාදෙට, ජාති ජාතිත් සහ ගහනව."
පොල් ගෙඩියක් දෙකක් වත්තෙන් ඇහිඳන් යන අතර හෝ අගහිග කමක් පිරිමසාගැණීමට ආ විටෙක හාමිනේ සමග මොහොතක් දොඩමළුවන අසල්වැසියෙකු ඇගෙන් සමුගන්නේ එසේ කියමිනි. ගම්මුන් කොතෙක් දෙස්දෙවොල් තිබ්බත් ලොකුහාමිනේගේ පාදපරිචාරිකාව ගැන අබමල් රේණුවක අහිතක් ඇතුළ නොවීය. ජේන්නෝන මොනව කරන්නද පුතන්ඩියගෙ දඩබ්බරකම් වලට.

ජේන්නෝනාගේ පවුල තරම් ගුරුගෙදරින් ලාභ ප්‍රයෝජන ගත් අනෙකෙක් ගම් තුලානෙහි නැති තරම්ය. සයිමන් ඇය සමග හොරෙන් පැන විත් තම දෙමව්පියන් පවුලෙන් එලවා දැමූ පසු යනඑන මං නැතිව සිටියදී දිනක් පළමුවරට ගුරුගෙදර වත්තට ඇතුළුවූයේ බඩගින්නට යමක් ඉල්ලා ගැණීමටය. ගේට්ටු කණුවේ රන්වන් අකුරින් "ගුරුගෙදර" නාම පුවරුව ඔබ්බවා තිබුණි. ගෙවත්ත දෙස බල බලා ඔවුහු එතැනම රැඳී සිටිද්දී
"එමු එමු ඇතුලට"
කියා ඉස්තෝප්පු හාන්සිපුටුවේ වාඩි වී සිටි ලොකු ඉස්කෝලෙ මහත්තයා ඔවුන්ට කතාකලේය. ලොකුහාමිනේ තොරතුරු කතා කලේ කුස්සිය පැත්තෙන් ගෙට ගොඩවූ විඩාපත් ගැබිණියට මවක සේ බත්මාළු බෙදා සංග්‍රහ කිරීමෙන් පසුවය.

එදා සිට ටික දිනක් දෙදෙනා ගුරුගෙදර තාවකාලිකව නවාතැන් ලබද්දී ඔවුන්ගේ ජීවිතයට යහපත් වැඩ පිළිවෙළක් ගුරු යුවළ විසින් සැකසුණි. වරින් වර පාසැල් කීපයකම උපගුරු මුල්ගුරු පදවි ඉසිලූ දෙමහල්ලන්ට තමන්ගේම දරුවන් සිටියේ නැත. ඔවුන්ගේ අසීමිත දරුපෙම අවට ගම් දනව්වල සෑම තරාතිරමකම දරුවෝ නොඅඩුව භුක්ති වින්දෝය. දරුවනට නිවැරදි අධ්‍යාපනය දීමට අමතරව ඔවුන්ගේ හැදියාව වැඩිදියුණු කිරීමට ඔවුන් කැප වී සිටියේ රාජකාරි මට්ටමින් පමණක් නොවේ. ලොකු ඉස්කෝලෙ මහතා තම පියා ධාර්මිකව උපයා ගත් සියළු දේපලෙහි එකම උරුමක්කාරයා විය. ගමේ අන් ධනවතුන්ගේ පරම්පරාගත දේපළ සුරාවට, සූදුවට හා දුරාචාරයට ඇබ්බැහිව නැති නාස්ති වෙද්දී ලොකු ඉස්කෝලෙ මහතාගේ පෞද්ගලික දේපලින් වෙරළු ගෙඩියේ සිට ගොඩමඩ ඉඩම් කැබැල්ල දක්වා දුගී දුප්පත් ගැමියන්ගේ යහපත වෙනුවෙන් වෙන් කර තිබුණි. දානපතියන් ලෙස අදම්ටුවන්ගේ නම් ගස්ගල් වල ලියැවෙද්දී ගුරු යුවළගේ දැහැමි කම් ගුණවත් අසරණ මිණිසුන්ගේ හදවත් තුළ පමණක් සණිටුහන් වී තිබෙන්නට ඇත.

කියා පිටවී යන ඇය ඇසිපිය හෙලන පමාවෙන් ආපසු පැමිණේ.

සයිමන්ට රැකියාවක් ලැබුනාට පසු තම දෙමව්පියන් තුළ තිබූ අමනාප කම් ටිකෙන් ටික දියවී ගියා සේය. මිණිබිරියගේ ආදරය හා හපන්කම් ඔවුන් තම පවුල වෙත ඇද බැඳ තබා ගැණීමට තුඩු අදිසි බලයක් වැන්න. ඇය සාමාන්‍ය පෙළ විභාගයෙන් සමත්ව මධ්‍ය මහා විද්‍යාලයක නේවාසිකාගාරයට ඇරලන දා උදේ කැවුම් කිරිබත් මේසයක් ගුරුගෙදර ද සූදානම් විය. යසවතී ඇරලන්නට යන සයිමන් අත ලොකු ඉස්කෝලෙ මහත්තයා රුපියල් සීයක් මිටමොලවා ඇය වෙනුවෙන් ඉතිරි කිරීමේ ගිණුමක් අරඹන ලෙස අවවාද කලේය.

ජේන්නෝනාගේ පුතා තම දියණිය මෙන් ඉගෙණීමට ආශාවක් නො දැක්වීම ගැන ඇය කොතෙකුත් මැසිවිලි කීවාය. එවා අසා සිටින ලොකුහාමිනේ ඇය අස්වසන්නට මෙසේ කියන්නීය.
"එහෙම තමයි ජේන්නෝනො හැම දරුවටම එකවගේ ඉගෙන ගන්න බැහැ, අතේ ඇඟිලි පහම එක වගේ නෙවෙයිනෙ."
"අනේ මන්ද හාමිනේ අපි නැති කාලෙක මූ මොනව කරගනීද කියල."
කියා ඇය නිහඬ වේ.

කුරුළු පැටියෙකුට ගලකින් විද කැටපෝලය ද අතක එල්ලාගෙන ආ තිලක
"අම්මෙ මේ........"
කියා මළකුණ මවට විදහා පෑවේ ඇය ලොකුහාමිනේ සමග පසුම්දුලේ කොස් ගෙඩියක මදුළු ගලවමින් සිටියදීය.
"ඔය.......... කියල කට ගන්න හම්බ උනාද, බලන්න හාමිනේ මුට මොනව කලහම ඇද්ද? පව්කාරය, දැම්ම ඉදලම නරකාදියට පාර කපා ගන්න හදනව. මූ නං මගෙ දරුවෙක් නෙවෙයි හාමිනේ."
අතේ කොහොල්ලෑ පිටින්ම මැටිකෝප්පයට උඩින් පැන ගිය ජේන්නෝනා කැටපෝලය උදුරා ගෙන
"දූවපිය යන්න මගෙ ඇස්දෙකට නොපෙනි." කියා කොලුවාගේ පස්ස පැත්තට දෙකක් දී එළවා ගත්තාය. කැටපෝලය කඩා කෝපි ගාලට විසිකල ජේන්නෝනා යළි බංකුව මත පතිත වී පිටිඅත්ලෙන් කඳුළු පිසදා ගත්තාය.

ගමේ පාසලට ගිය තිලක නමය පංතියට එන්නට පෙර දෙතුන් වරක්ම පාසැල් ගමන නවත්වන්නට ඇත. ඒ හැම වතාවකම ලොකු ඉස්කෝලෙ මහතා හෝ ලොකුහාමිනේ පාසැලේ මුල්ගුරුතුමා හමුවී කතාකර තිලකව නැවත පන්තියේ ඉන්දුවේය.

සිතුවම - සුනිල් කුමාර අමරකෝන්

එයින් ද පළක් නොවූ කල තිලකව යහමගට ගෙන ජේන්නෝනාගේ සිත සනසාලීමට කළ යුතු දෙයක් ඇත්දැයි ගුරු යුවළ නිතර කතිකා කලහ. ගමට සිටි එකම වෙද මහතා මිය යාමෙන් පසු උණට හෙම්බිරිස්සාවකට කොත්තමල්ලි කටුවැල්බටු ටිකක් ගැණීමටවත් තැනක් නොතිබුණි. සතියකට වරක් පමණක් මදුරාවල ඩිස්පැන්සරියට පැමිණෙන දොස්තර මහතා එන තුරු අසල ගම් කීපයේම රෝගීහු බලා සිටියෝය. මෙයට තරමක හෝ පිළියමක් වශයෙන් වෙද මහතාගේ බිරිඳගෙන් වෙද කාමරෙ අත්හළ බෙහෙත් රාක්ක ටික සාධාරණ ගානක් දී මිලයට ගෙන සිංහල බෙහෙත් ශාලාවක් විවෘත කෙරුණි. මතු ගරාජයකට ගැණීමේ අදහසින් ගෙට යාබදව තනා තිබූ ගොඩනැගිල්ල ඒ සඳහා යොදා ගත්තේය. මෙහි කළමනාකරණය තිලකට පැවරීය. නොමිළයේ කසායක් කිරාගෙන යා හැකි වූ මෙතැන පිං බෙහෙත් ශාලාව ලෙස පසුව ප්‍රකට විය. කැමති කෙනෙකුට ශත පහක් දහයක් දමා යන්නට පිං කැටයක් පසෙකින් තබා තිබුණි. කල් යත්ම දවසකට දහ දොලොස් දෙනෙක් කසාය ගෙන යන්නට පිං බෙහෙත් ශාලාවට පැමිණුනි. මසකට වරක් පමණ අඩුපාඩු බෙහෙත් කළමනා ගෙනෙන්නට ලොකුහාමිනේ මුදල් දී තිලක්ව හොරණ පිටත් කර යවයි. එහි යන්ට පෙර තිලක පිං කැටයේ එකතුවන මුදල ද ඊට එකතු කර ගනී. බෙහෙත් ශාලාවේ වැඩ කිරීම වෙනුවෙන් තිලකට ගුරුගෙදරින් සෑහෙන මුදලක් ලැබුනත් බෙහෙත් කිරන අතරවාරයේ පිංකැටයට වැටෙන කාසිය ගැනත් තිලක විමසිලිමත් වීම ගැන ගැමියෝ ඔහුට රහසේ දොස් පැවරූහ.

උළු ගෙයක් තනා ගැණීමට ඉඩම් කෑල්ලක් මිලදී ගැණීම සඳහා සයිමන් තම පවුලේ සියලුදෙන සමග බුලත් අතකුත් රැගෙන ගුරුයුවළ බැහැදැකීමට පැමිණියේය. මෙදින තවත් වැදගත් කටයුත්තක් සිදුවිය. එනම් යසවතී ශිෂ්‍යගුරු විභාගයෙන් සමත් බව කෘතගුණ පූර්වකව ස්වාමිදරුවනට දැණුම් දීමයි.

මිණිබිරියට හොඳ කලදසාවක් යාවි යැයි සැනසුම් සුසුමක් හෙලූ සයිමන්ගේ මව පෙරළා එද්දී කියමින් ආවේ "බුදු වෙන්න පෙරුම් පුරන බෝදිසත්තයෙක් ද කොහෙද" කියාය. එදා ලොකු ඉස්කෝලෙ මහතා කතා කල වචන බණපද කටපාඩමින් කියන්නා සේ යනඑන ගම්මුන්ට ද නිතර දෙවේලේ ඈ පැවසුවාය.
"ඔව්, ඔව් එව දෙමව්පියන්ගෙ යුතුකං. අපට ආරංචිවුනා ලොකු දෝණි ශි'ෂ්‍යගුරු විභාගෙ පාස්වුන බව. මි........දීගතලග දෙන දවසක ගෙයක් දොරක් හදාගෙන තියෙන්න එපෑ.........එක අහන්නම ද තකහනියක් බුලත්හුරුළුත් අරගෙන ආවෙ. ඔය යන එන වෙලාවක අහන්න තිබුනනෙ.
හොඳයි. අර....... ඉහළ ගොඩැල්ලෙ පොල් කෑල්ලෙන් අක්කර බාගයක් වෙන් කරල දෙන්නංකො."
"එක අපරාදෙයක් නේද මහත්තෙයො? පොල් ගස් සෑහෙන ගානක් ඉදිරෙනවනෙ. නරිගල දිහෑ දෙණියෙන් වුනත් කමක් නෑ."
""ඒ හරිය ගෙයක්දොරක් හදන්න හොඳ බූමියක් නෙවෙයි. ලොකු ගංවතුරක් එහෙම ආවොත් යටවෙන්නත් පුළුවං. ඇරත් එකෙ එළවළු කොටුවක් කර ගන්න කියල මම බුරම්පිට කිව්ව ළඟදි දවසක්. ගනුදෙණු ගැන කලබල වෙන්න දෙයක් නැහැ, සයිමන් සිංකෙදාට පුළුහන් තරමක් දෙනව, ගේ හදන්නත් බර වියදමක් දරන්න වෙනවනෙ."
"කාටවත් ණය තුරුස් එහෙම වෙනව නෙවෙයි!"

පරණ රබර ගස් උදුරා සුද්ද කර තිබූ අක්කර පහක් පමණ වූ ඉඩමක් නැවත වගා නොකර වල්බිහිවන්නට හැර ඇත්තේ මන්දැයි ගම්මුන් අතර කසුකුසුවක් ඇතිවන්ට පටන් ගත්තේය. මැණික්දෙණිය යැයි ප්‍රකට එය නොවටිනා ගනන් දී මිලයට ගැණීමට ඇතැම් මැණික් මුදලාලිලා එවූ තැරැව්කාරයන් ද ලොකු ඉස්කෝලෙ මහතා එය කීයටවත් විකුණන්නේ නැතැයි කියා ආපසු හරවා යැවූ වාර අනන්තය.
මේ ඉඩම පිළිබඳ රහස දත්තේ තමා හැරුණු විට තම බිරිඳ පමණි. අවසන් වරට ඉඩකඩම් පිළිබඳව දෙමහල්ලෝ කතාබහක යෙදුනේ සයිමන් සිංකෙදාට අක්කර බාගය තීන්දු කළ දින රාත්‍රියේය.
"මැණික්දෙණියෙ අපි මහලු නිවාසයක් හදමු හාමිනේ."
"එකනං හොඳ අදහස, එත් ඕව හදන්න සෑහෙන වියදමක් යයිනොවැ මහත්තය, අපට කොයින්ද ඔච්චර මිලමුදල්?""
තියන තරමක් දෙමු. උපනන්ද පුතාටත් කියමු මේ ගැන.
උපනන්ද පුතා යැයි ඔහු සඳහන් කලේ කලකට පෙර තම නිවසේ රැඳී සිට ඇපොතිකරි විභාගය සමත්ව දැනට ඉංගිරිය රෝහලෙහි සේවය කරන ලොකු ඉස්කෝලෙ මහතාගේ ඥාති පුත්‍රයෙකි.
"අපිට බැරියැයි ඩිස්පැන්සරියක් කරගෙන යන්න මේ ගේ එයාට ලියල දෙන්න."
"එකත් එහෙමයි කියමුකො, අපි දෙන්න කොහෙද යන්නෙ?"
"අපිත් ඔය මහලු නිවාසෙ වැඩ කටයුතු වලට උදව් දීගෙන එකෙම ඉමු, උපනන්ද පුතා ඇවිත් අපිවත් බලල අසණීප එහෙම තියන තවත් අය ඉන්නවනං ඒ අයටත් බේතක් හේතක් කරල නොයායැ............?"
"මහත්තයගෙ කැමැත්තක්"

මහලු නිවාසය ඉදි කිරීමේ අභිලාෂය මුදුන් පමුණුවා ගැණීමට ගුරු යුවළ නොදැරූ උත්සාහයක් නැත. තමන්ගේ ගමන් පහසුව සඳහා වාහනයක් ගැණීමට විශ්‍රාම යෑමටත් පෙර සිට ඉතිරිකළ මුදල ඔච්චු මුළුමනින්ම එහි මූලික වැඩ කටයුතු සඳහා යට කලෝය. තම කාලය හා ශ්‍රමය වැය කරමින් දිවාරෑ නොබලා වෙහෙස වූහ. මෙම සත් කාර්යයට තමන් බලාපොරොත්තු වූ පරිදි අන් කිසිවෙකු උර දෙන බවක් පෙනෙන්නට නොතිබුණි. අපේක්ෂා භංගත්වයෙන් සිත් තැවුලට පත් ලොකු ඉස්කෝලෙ මහතා රෝගාතුර වන විට නිම වුවේ මහලු නිවාසයේ අත්තිවාරම දැමීම පමණකි. තම සිහිනය සැබෑ වනු දැකීම සඳහා ලෙඩ ඇඳේ සිට මැණික්දෙනිය රජයට පවරා දෙන්නට කටයුතු සූදානම් කර තිබියදී ලොකු ඉස්කෝලෙ මහතා මිය ගියේය.

කනප්පුව මත වූ පිත්තල මංජුසාවේ තිබූ ඇස්කණ්ණාඩිය දමා ගත් ලොකු හාමිනේ බිත්ති ඔරලෝසුව බලද්දී උදේ අටට ආසන්නය. රේඩියෝව වසාතිබූ ආවරණය ඉවත් කර එය බැටරියට සම්බන්ධ කරන්නට සැරසුනේ ඉරිදා උදෑසන ධර්ම දේශනාවට සවන් දීමටය.

"හාමිනේ........හාමිනේ.......ලොකුහාමිනේ..."
ලොකු කලබලයකින් බුරම්පි සිංකෙදෝ කවදාවත් නැති විදියට ගුරුගෙදර සාලයටම දුවැවිත්
"හාමිනේ........හාමිනේ.......ලොකුහාමිනේ..."
"මොකද මොකද කියනව"
"අන්න අන්න මැණික්දෙණියෙ කව්ද මිනිස්සු වගයක් පතල් කපනව"
"මොනව...? එහෙම කරන්නෙ කොහොමද? එක මහත්තය නැතිවෙන්න කලින් ආණ්ඩුවට දීලනෙ තියෙන්නෙ. අත්තිවාරමේ ඉඳල ඉතුරු වැඩටික සමාජසේවා දෙපාර්තමේන්තුවෙන් කරනව කියලනෙ කිව්වෙ."
"එකනං මං දන්නෑ හාමිනේ, ගමේඋං කියන්නෙනං අර ජේන්ගෙ වසවර්තිය......., තිලකෙ.........., රුපියල් පන්දාහක්ද කොහෙද අරගෙන ගංසබාවෙ මහත්තුරුත් එක්ක එකතුවෙලා මැණික් කාරයින්ට විකුනලයි කියල"

ඇස් උඩ ඉන්දුන ලොකුහාමිනේ කුමක් කරම්දැයි එකවර සිතාගනු නොහැකිව කඩියෙකු සේ දුවන බුරම්පිගේ පස්සෙන් මැණික්දෙනියට යන්ට ගිය ගමන ආපසු හැරී ඉස්තෝප්පුවේ ඇඳි පුටුවේ ඇඳි ගත්තාය.
එහෙම වැඩක් කරන්න බැරි කෙනෙක් නෙවෙයි තිලක, පඩියකුත් දෙද්දි පිංකැටෙත් කී

34 පිටට

AAK Electricals
- All Type of Electrical Work
- Split Air Con Installations
- Security Alarms

For friendly and reliable service

Kingsly Perera
Tel/Fax 9457 2307
Mob 0414 412 954

Rec 17466